සැ.යු.- 2021.06.14 වැනි දින පළවූ අංක 2232/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 06-339, 06-340 හා 06-341 යටතේ සිංහල භාෂාවෙන් පළවූ නිවේදන මුද්‍රණ දෝෂ සහිත බැවින්, එම නිවේදන සංශෝධනය කර 2021.06.15 වැනි දින අංක 2232/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2232/27 - 2021 ජුනි මස 15 වැනි අඟහරුවාදා - 2021.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

සංශෝධනයයි

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම**

2021.06.14 දිනැති අංක 2232/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ අංක 06-339, 06-340, 06-341 දරන දැන්වීම් මුද්‍රණ දෝෂ සහිත බැවින් පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතු බව මෙයින් දන්වමි.

නාවලපිටිය නගර සභාව

නාවලපිටිය නගර සභාවේ සභාපති වන හේවා වඩුගේ සසංක සම්පත් සංජීව මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව නාවලපිටිය නගර සභාවේ තේරීම්භාර නිලධාරී මාපා මුදියන්සේලාගේ සේන කුමාරසිරි බණ්ඩාර මාපා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කර සිටිමි.

**එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,**
තේරීම්භාර නිලධාරී,
නාවලපිටිය නගර සභාව.

2021 ජුනි මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.


1A - G 034438 — 55 (2021/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තංගල්ල නගර සභාව

තංගල්ල නගර සභාවේ සභාපති වන වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන් මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සහික ධුරය ඔහු විසින් අතහැර ඇති බව තංගල්ල නගර සභාවේ තේරීම්භාර නිලධාරී රවීන්ද්‍ර සුහාෂණ වෙදගේ වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

**රවීන්ද්‍ර සුහාෂණ වෙදගේ,**
තේරීම්භාර නිලධාරී,
තංගල්ල නගර සභාව.

2021 ජුනි මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

---

වැලිගම නගර සභාව

වැලිගම නගර සභාවේ සභාපති වන රෙහාන් ධනුෂ්ක විජේරත්න ජයවික්‍රම මහතා එක්සත් ජාතික පක්ෂයෙහි සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සහික ධුරය ඔහු විසින් අතහැර ඇති බව වැලිගම නගර සභාවේ තේරීම්භාර නිලධාරී තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදි වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

**තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදි,**
තේරීම්භාර නිලධාරී,
වැලිගම නගර සභාව.

2021 ජුනි මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

06 - 342

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.